**ගල්නෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයට අදාලව ගෙවූ විගණන ගාස්තු රු.129,246 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වියදම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරන ලද ව්‍යාපෘති 08 ක ණයගැති හා ණයහිමි වටිනාකම් නිවැරදිව ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් කර්මාන්ත ණයගැතියන් රු.1,033,885 ක් හා කර්මාන්ත ණයහිමියන් රු.53,413 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
------------------

සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.44,434,031 ක් අයවිය යුතුව පැවති අතර එම මුදලින් රු.1,059,493 ක් වර්ෂ 2 ත් 8 ත් අතර කාලපරාසයක් තුළ ක්‍රියාත්මක කල ව්‍යාපෘති 13 කින් අයවිය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.45,596,460 ක ව්‍යාපෘති ණයහිමියන්ගෙන් රු.1,082,088 ක් වර්ෂ 2 ත් 8 ත් අතර කාලපරාසයක් තුළ නිම කළ ව්‍යාපෘති 22 ක් වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණි.

### 1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික අනියම් සේවකයන්ගේ සේවය අවසන් කල විට ඔවුන්ට පාරිතෝෂිත ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i | මු.රෙ.396 (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.8,950 ක්වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii | මු.රෙ.571 | එකතුව රු.92,000 ක් වූ ඉකුත් තැන්පතු 68 ක් සම්බන්ධයෙන් තැන්පතුකරුවන්ට ගෙවීමට හෝ සභා ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,520,361 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,991,585 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

(අ). සමාලෝචිත වර්ෂයට  අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කළ ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017.01.01 හිඟ මුදලින් වටිනාකම | 2017 බිල්කළ මුදලින් වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| කසල බදු | 573,300 | 1,084,600 | 144,950 | 939,450 | 573,500 |
| කඩකුලී | 138,600 | 451,500 | 50,000 | 388,722 | 151,378 |
| නලළිං ගාස්තු | 156,900 | 500 | - | 200 | 157,200 |
| වෙළඳ බලපත්‍ර | 110,575 | - | - | - | 110,575 |
| ටෙන්ඩර් මත කුලී | 303,743 | 554,150 | 5,000 | 553,650 | 299,243 |
| උසාවි දඩ | 6,223,542 | 6,678,255 | 1,143,695 | 6,223,542 | 5,534,560 |
| කර්මාන්ත  හා ව්‍යාපාර බදු | - | 1,340,500 | - | 1,135,900 | 204,600 |
| කර්මාන්ත  හා ව්‍යාපාර බදු | - | 536,740 | - | 408,490 | 128,250 |
| මුද්දර ගාස්තු | 314,550 | - 265,000 | - | - | 579,550 |
| එකතුව | 7,821,210 | 10,911,245 | 1,343,645 | 9,649,954 | 7,738,856 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය ආරම්භයේ පැවති රු.7,821,210 ක හිඟ ආදායම් වලින් වර්ෂය තුළ රැස් කර තිබුණේ රු.1,343,645 ක් පමණි.

(ආ) වර්ෂය තුල බිල්කළ ආදායමින් සියයට 12 ක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන නොතිබුණි.

2.2.2 වරිපනම් හා බදු
-----------------

(අ) වරිපනම්
-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශවල පිහිටියාවූ නිශ්චල දේපලක හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම පදනම් කරගෙන වරිපනම් බදු අය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කසල බදු
----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 288 කින් අයවිය යුතු හිඟ කසල බදු රු.573,500 ක් ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

(අ) මුද්දර ගාස්තු
--------------

සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර රු.265,000 ක මුද්දර ගාස්තු ආදායමක් ඇස්තමේන්තු කර ඉන් කිසිදු ගාස්තුවක් සමාලෝචිත වර්ෂය තුළ රැස්කර ගෙන නොතිබුණි.

(ආ) උසාවි දඩ
------------

2017 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.6,223,542 ක උසාවි දඩ වලින් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුනේ රු.1,143,695 ක් හෙවත් සියයට 18 ක් පමණි.

2.2.4 වෙළඳ බලපත්‍ර
-----------------

ඒකක 522 කින් අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.110,575 ක් ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්ය සාධනය
------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව

හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුල හා ඉකුත් වර්ෂවල ඉටුකළයුතු සංවර්ධන ව්‍යාපෘති 17 ක් සඳහා රු.2,876,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ නමුත් එම ව්‍යාපෘති 2018 ජුනි 20 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදනය සඳහා පුර නැගුම ව්‍යාපෘතිය මගින් රු.14,796,235 ක වියදමක් දරා ඉදිකර 2014 වර්ෂයේදී සභාවට පවරා තිබුණ බුල්නෑව සතිපොළ ගොඩනැගිල්ල හා වැසිකිලිය අරමුණ සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ii) 2014 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර සභාවට භාරදී තිබූ රු.28,500,000 ක් වටිනා ගල්නෑව නගරයේ ඉදිකර තිබූ පොදු ශ්‍රවණාගාරය 2018 ජුනි 20 දින වන විටත් අදාල අරමුණ සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභාව විසින් රැස් කරනු ලබන කැලිකසළ වලින් දිරාපත් නොවන අපද්‍රව්‍ය පිළිසරු ව්‍යාපෘතිය අසල රජයේ භූමියකට බැහැර කර තිබුණි. එම කැලිකසළ පරිසරයට නිරාවරණය වීමෙන් ප්‍රදේශවාසීන්ට සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීමට සිදුවන අතර දිරාපත් නොවන ද්‍රව්‍ය දහනය කිරීම නිසා පරිසර හානියක් සිදුවෙමින් පැවතුණි.

(ඊ) තිරසර සංවර්ධනය

---------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

ප්‍රධාන අමාත්‍යාංශය මගින් 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු ට්‍රැක්ටර් රථය 2018 ජුලි 31 දින වනවිටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකර ධාවනයට ගෙන තිබුණු අතර එම හේතුව නිසා රථය සඳහා රක්ෂණාවරණයක්ද ලබාගෙන නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------

වසර ගණනාවක සිට එකතුව රු. 1,638,000 ක් වටිනා යන්ත්‍ර උපකරණ ඒකක 25 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාකර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් සභා විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ සිදුකල ව්‍යාපෘති 02 ක් සඳහා ගෙවීම් කිරීමේදී ඉටුනොකල වැඩ විෂයයන් සඳහා එකතුව රු.544,955 ක් ගෙවා තිබුණි.

(ආ). කදුකිච්චාගම වැව දක්වා මාර්ගය මීටර් 200 ක් අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.900,000 වැයකර තිබුණි. මෙහිදී වැඩ විෂය අංක 03 යටතේ වැලි අතුරා තල කම්පනයක් සිදුකර නොතිබියදී රු.131,932 ක් සහ වැරදි රේටයන් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් රු.39,600 ක් වශයෙන් එකතුව රු.171,532 ක් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. පරීක්ෂණ දිනවන විට මෙම මාර්ගයේ දෙපස ගිලා බැස තිබුණි.

(ඇ) දියබැටියාගම මාර්ගය මීටර් 200 ක් අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.899,100 වැයකර තිබුණි. වැඩ විෂයය අංක 02 ට අනුව කොන්ක්‍රීට් ගල්බැම්ම නියමිත ප්‍රමාණය ඉටු නොකිරීම සහ වැඩ විෂයය අංක 03 යටතේ මි.මී 75 ක් වැලි අතුරා තල කම්පනය සිදු නොකිරීම හේතුවෙන් රු.159,400 ක් වැඩියෙන්ද, වැරදි රේටයන් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැඩිපුර රු.39,600 ක් වශයෙන් එකතුව රු.199,000 ක් අවිධිමත් ලෙස ගෙවා තිබුණි.

4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව තත්‍ය ආදායම් සියයට 83 සිට සියයට 189 දක්වා පරාසයක විචලනයන් ද වියදම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂව තත්‍ය වියදම සියයට 12 සිට සියයට 86 දක්වා පරාසයක විචලනයන් ද පැවතුණි. ඒ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර තිබුණ චක්‍රලේඛය හා උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2016 මැයි 11 දිනැති අංක NCP/CS/01/විගණන දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලනය

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ------------- | ------------ |
| (අ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | දිරාපත් නොවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට කටයුතු නොකිරීම |
| (ආ) | ණයගැතියෝ හා ණයහිමියෝ | කාල විශ්ලේෂණය පිළියෙල නොකිරීම. |
| **(ඇ).** | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | i. කාල විශ්ලේෂණය පිළියෙල නොකිරීම.<br>ii. දිර්ඝකාලීනව පැවත එන ශේෂ හඳුනා ගෙන නිරවුල් නොකිරීම. |
| (ඇ). | සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |